# සිංහල භාෂාවේ ණ-න-ල-ළ භේදය: භාවිතය හා පරිණාමීය ලක්ෂණ පිළිබඳ පදිම විචාරාත්මක අධ්‍යයනයක්

හඟුරන්කෙත සීලවිමල හිමි
hanguranke thseelavimala@gmail.com

**සාරසංක්ෂේපය**

සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී එහි මූලිකාංග අතර පද පරිණාමයට ප්‍රමුඛත්වයක් හිමි වේ. පද පරිණාමයේ දී දැකිය හැකි විශේෂ අංගයක් ලෙස ශබ්ද හඳුනා ගත හැකි ය. එකී ශබ්ද උච්චාරණ විවිධතා අනුව විවිධ ප්‍රභේදවලට බෙදෙන බව කණ්ඨජ, දන්තජ සහ මූර්ධජාදි ප්‍රභේද මගින් පැහැදිලි වේ. එම ප්‍රභේදවලට අයත් දන්තජ සහ මූර්ධජ ශබ්ද වන ණ-න-ල-ළ යන ශබ්ද සිංහල භාෂාවේ විවිධතා දක්වන්නේ කවර පදනමකින් ද යන්න විමර්ශනය කිරීම මෙම පර්යේෂණයෙන් සිදු වේ. මෙම පර්යේෂණයේ දී සිංහල භාෂාවේ ණ-න-ල-ළ භාවිතය උච්චාරණ විශේෂතා මූලික කොට ගෙන පවතින්නේ ද නැතහොත් පරිණාමීය ලක්ෂණ උපයුක්ත ව පවතින්නේ ද යන්න සොයාබැලීම මූලික අරමුණ යි. එය ම පර්යේෂණයේ ගැටලුව ලෙස ද අවධානයට ලක් කෙරේ. ණ-න-ල-ළ භේදයේ භාවිතය හා පරිණාමීය ලක්ෂණ විමසීම පරමාර්ථ කර ගත් මෙම පර්යේෂණයේ දී පළමු ව එකී භේදය සහිත පද රැස් කිරීම සිදු කෙරේ. පර්යේෂණ නියැඳිය ලෙස යොදා ගැනුණේ **අමාවතුර** හා **බුත්සරණ** කෘතිවල සඳහන් නාම වචන පමණකි. අනතුරුව සපයා ගත් දත්ත මූල භාෂාවන්හි කවරාකාරයෙන් දක්නට ලැබේ ද යන්නත් පරීක්ෂා කර පදිම විචාරාත්මක විග්‍රහයක් සිදු කරනු ලැබේ. පදිම විචාරාත්මක න්‍යාය උපයෝගී කර ගැනීමේ දී ජාත්‍යන්තර ශබ්ද ශික්ෂා හෝඩියට අනුව ප්‍රතිලේඛනය සහ සමාන අවස්ථා උච්චාරණ රටා අනුව වර්ගීකරණය කර ගැනීම දත්ත විශ්ලේෂණයට යටත් වේ. මෙම පර්යේෂණයෙන් අපේක්ෂිත ප්‍රතිඵල වන්නේ සිංහල භාෂාවේ නාම වචනවල යෙදෙන ණ-න-ල-ළ අක්ෂර කවර පදනමකින් යෙදී ඇත් ද යන්න හෙළි කිරීමයි. තවදුරටත් සිංහල භාෂාවේ ණ-න-ල-ළ භේදයේ පැවැත්ම කෙරෙහි හේතු වූ උච්චාරණමය හෝ පරිණාමීය සාධක මෙම පර්යේෂණයෙන් විශද වනු ඇති බව මූලික අපේක්ෂාවකි.

**ප්‍රමුඛ පද:** උච්චාරණ විශේෂතා, ණ-න-ල-ළ භේදය, පද පරිණාමය, පදිම විචාරය, ශබ්ද

# Na-ɳa-la-ɭa Division of Sinhala Language: A Morphological Study of Usage and Evolutionary Characteristics

හඟුරන්කෙත සීලවිමල හිමි
hangurankethseelavimala@gmail.com

**Abstract**

In focusing on the origin and evolution of the Sinhala language, the evolution of the word has a fundamental place among its basic elements. In the evolution of words, sounds can be identified as a special feature. Varieties such as Alveolar (Dental) and Retroflex, etc. reveal that these sounds are divided into various divisions according to variations in the articulation of sounds. This research investigates on what basis the sounds Na-ɳa-la-ɭa, which belong to those varieties, indicate the diversity of the Sinhala language. The main objective of this research is to study whether the usage of Na-ɳa-la-ɭa in the Sinhala language is based on phonological features or evolutionary features. It is also used as the research problem. In this research, which aims to investigate the usage and evolutionary characteristics of Na-ɳa-la-ɭa, first, words with that difference are collected. Sample of the research contains only the nouns mentioned in the books *Butsaɽənə* and *Ama:vatuɽə* are used. Next, a morphological analysis is performed by examining how the collected data appear in the original languages. Data analysis includes transcription according to the International Phonetics Alphabet and classification of the same instances according to phonetic patterns. The expected result of this research is to reveal the base of Na-ɳa-la-ɭa characters used in nouns in the Sinhala language. Furthermore, it is a basic expectation that the phonological or evolutionary factors that led to the existence of differentiation of na-ɳa-la-ɭa in the Sinhala language will be clarified through this research.

**Keywords:** Alveolar-Retroflex, Evolution, Na-ɳa-La-ɭa Division, Phonetics, Sinhala Language